# නව අධිකරණ පරිපාලන බල ප්‍රදේශ ලබන වසරේ සිට ක්‍රියාත්මක කරනවා

## - අධිකරණ අමාත්‍යාංශය

**රෝෂන් තුෂාර**

නව අධිකරණ පරිපාලන බල ප්‍රදේශ ලබන වසරේ සිට ක්‍රියාත්මක කරන බව අධිකරණ අමාත්‍යාංශය පවසයි.

1978 අංක 03 දරන පනත අනුව නව අධිකරණ බල ප්‍රදේශ නිර්ණය කැර ඇති අතර එම සිතියම් ලබන නොවැම්බර් මස 01 දින ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය.

2006 ඇමැති මණ්ඩල තීරණයක් අනුව හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිශ්ශංක උදලාගම මහතාගේ ප්‍රධානත්වයෙන් අධිකරණ බල සීමා නිර්ණ කමිටුව පත් කරන ලද අතර එම කමිටුවේ නිර්දේශ යෝජනා අනුව නව අධිකරණ කලාප ස්ථාපිත කැර ඇත.

එම කමිටුවේ නිර්දේශ අනුව මහජනතාවට අධිකරණයක් කරා යැමේ දුර දළ වශයෙන් කිලෝමීටර් 25කට අඩු විය යුතුය. එක් පොලිස් ස්ථානයක් අධිකරණ දෙකකට හෝ ඊට වැඩි ගණනකට යැම අවම කිරීම, එක් අධිකරණයකට යොමුවන නඩු සංඛ්‍යාව අවම කිරීමද ඒ අතර වේ. මේ නිර්ණයන් අනුව සිතියම් ගත කැර ඇති නව අධිකරණ බලසීමාවන් ස්ථාපිත කිරීමේ කටයුතු අධිකරණ අමාත්‍යාංශය මගින් ආරම්භ කැර ඇත. ග්‍රාම සේවා වසම් 14000ක තොරතුරු හා මහජන අදහස් සලකා බැලීමෙන් පසුව නව යෝජනා රුසක් අමාත්‍යාංශය ක්‍රියාත්මක කරයි.

නව අධිකරණ 50ක් අළුතින් ස්ථාපිත කිරීම ඒ අතර වේ. ඒ අනුව කිළිනොච්චිය, තංගල්ල, මාතලේ, නුවරඑළිය හා කුලියාපිටිය මහාධිකරණ පහක් ස්ථාපිත කැරේ. බද්දේගම, මොරවක, තෙල්දෙණිය, දඹුල්ල, වලපනේ, කැබැතිගොල්ලෑව, කැකිරාව, හිඟුරක්ගොඩ මහියංගනය, වාලච්චේනෙයි, මූතූර්, කිළිනොච්චිය, මුලතිව් හා මිනුවන්ගොඩ සඳහා දිසා අධිකරණද උඩුගම, දෙයියන්දර අඟුණුකොළපැලැස්ස, ගලගෙදර , තාළල, වලපනේ, හිඟුරක්ගොඩ, පස්සර, මහියංගණය, සියඹලාණ්ඩුව, තිකවැරටිය, පොල්ගහවෙල, ආණමඩුව, මීරිගම, මාතර, ජා ඇල, කොලොන්නාව, බේරුවල, ලාහුගල, කිලිනොච්චිය සහ මුලතිව් යන ප්‍රදේශයන් හි මහේස්ත්‍රාත් අධිකරණ 21ක් ද කොත්මලේ, පාදෙණිය, බකමූණ, බිල්දූම්මුල්ල, තණමල්විල, අගලවත්ත, පානම, කුච්චවේලි, වෙලානි සහ හඟුරන්කෙත ප්‍රදේශවලට සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය 10ක් ද ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇත. 1978 පසුව අධිකරණ බලසීමා, සංශෝධනයක් සිදුව නොමැති බවද 1992 කමිටුවක් පත් කරන ලද නමුත් එහි නිර්දේශ ක්‍රියාත්මක නොවූ බවද සඳහන් කරන අමාත්‍යාංශය අධිකරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතාට 1978 අංක 03 දරන පනතෙන් හිමිව ඇති බලතල අනුව මේ අධිකරණ බල ප්‍රදේශ ක්‍රියාත්මක කරන බවද සඳහන් කෙළේ ය.